**ශීර්ෂය 427 - පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පශු සම්පත්,ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 18 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පශු සම්පත්,ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු

අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

. (අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 1.6.1 දේපල පිරියත හා උපකරණ

---

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනයෙහි කාර්යාල උපකරණ, පරිගණක උපකරණ, විද්‍යුත් උපකරණ, සන්නිවේදන උපකරණ, ගෘහභාණ්ඩ යන වත්කම් පිළිබඳ තොරතුරු ඇතුලත් නොවූ හෙයින් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ වෙනත් යන්ත්‍ර හා උපකරණ වටිනාකම වන රු.29,284,746 ක මුදල තහවුරු කර ගැනීමට නොහැකි විය. | මුද්‍රිත ස්ථාවර වත්කම් ලේඛනයේ ඉඩම්,ගොඩනැඟිලි,යන්ත්‍රෝපකරණ, රථවාහන යනාදිය පමණක් ඇතුලත්කරන බව දන්වන අතර ඔබ විසින් දක්වා ඇති අනෙකුත් වත්කම් ස්ථාවර වත්කම් ලෙජරයේ ඇතුලත් කරන බව කාරුණිකව දන්වමි. | **1978** දෙසැම්බර් **19** දිනැති අංක **842** දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි **502(2)** හි **11** වැනි පරිශිෂ්ටය පරිදි ස්ථාවර වත්කම් ලේඛනය අදාළ වන පරිදි විගණකාධිපතිගේ එකඟත්වය ඇතිව පවත්වා ගත යුතුය. |
| (ආ) | පොලිස් දෙපාර්තමේන්තුව , කාර්මික විද්‍යාලයඅ සහ සත්ව නිෂ්පාදනයන සෞඛ්‍යය දෙපාර්තමේන්තුව වෙත පවරා දී ඇති වටිනකම රු.24,900,000 ක් වූ වාහන 03 ක වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත්ව නොතිබූ අතර මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයෙහි අවසන් ශේෂය තුළ මෙම වටිනාකම ඇතුළත් වී ඇත්දැයි යන්න විගණනයට තහවුරු කර ගැනීමට අවශ්‍ය උපලේඛණ ඉදිරිපත් කර නොතිබුණි. | ඉහත වාහන 03 මේ වන විට මෙම රාජ්‍ය අමාත්‍යාංශය යටතේ නොපවතින බැවින් ද, එම වාහන වල ලියාපදිංචි අයිතිය මෙම රාජ්‍ය අමාත්‍යාංශය සතු නොවන හෙයින් ද, උක්ත වාහන 03මෙම රාජ්‍ය අමාත්‍යාංශයේ ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. | විගණනයට අවශ්‍ය සාක්ෂි නිවැරදිව ඉදිරිපත් කල යුතුය |

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

---

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය පවත්වාගෙන යනු ලැබේ | රෙගුලාසිය පරිදි රජයේ ගොඩනැගිලිවල සියළුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛන පොත යාවත්කාලිනව පවත්වා ගත යුතුය. |

## 1.6.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනයේ ඉදිරිපත් කර ඇති අත්තිකරම් ගිනුම් සාරාංශයේ වර්ෂය තුල හරස් සටහන් මගින් බැර කිරීම් රු.3,621,628 ලෙස දක්වා තිබුණද රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ වාර්ෂික සැසදුම් ප්‍රකාශයේ එම වටිනාකම රු.4,279,180 ක් වූයෙන් රු.657,552ක වෙනසක් නිරීක්ෂණය විය . | මූල්‍ය ප්‍රකාශනයේ ඉදිරිපත්කර ඇති අත්තිකාරම් ගිණුම් සාරාංශයේ වර්ෂය තුල බැර කිරීම් හරස් සටහන් මඟින් දක්වා ඇති වටිනාකම වැරදි ලෙස සටහන් කර ඇති බැවින් එය රු.4,279,180 ලෙස නිවැරදි විය යුතුවේ. එය සිදුවූ අත්වැරැද්දක් බව කාරුණිකව දන්වා සිටිමි.<br>කෙසේ වෙතත් අවසාන ශේෂය නිවැරදිව සඳහන් කර ඇති බවද වැඩිදුරටත් දන්වා සිටිමි. | භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් පදනම් කර ගනිමින් නිවැරදි අයුරින් තොරතුරු ඇතුලත් කල යුතුය. |

## 1.6.4 විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අමාත්‍යාංශය සතු වාහන 06ක ලියාපදිංචි සහතික විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | PF-7316 ඩබල්කැබ් රථය කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් තාවකාලිකව මෙම රාජ්‍ය අමාත්‍යාංශයේ ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ කාර්යය මණ්ඩලය වෙත නිල රථයක් ලෙස අනුයුක්ත කිරීම සඳහා ලබා දෙන ලද අතර, එහි ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත කෘෂිකර්ම අමාත්‍යාංශය සතුව පවතී.<br>JO - 6958 මෝටර් රථයේ සහ GD – 2079 ලෑන්ඩ්රෝවර් ජීප් රථයේ ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත් මෙම රාජ්‍ය අමාත්‍යාංශය සතුව නොපවතින අතර, එහි අනු පිටපතක් ලබා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු කරමි.<br>CAG – 8807 හා KX – 7664 මෝටර් රථ අයවැය චක්‍රලේඛ අංක 150 අනුව මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව මඟින් ලබා දී ඇති වාහනයක් වන බැවින්, මෙහි ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත මූල්‍ය කල්බදු පහසුකම් සපයා දී ඇති ලංකා බැංකුවේ බොරැල්ල ශාඛාව සහ නගර කාර්යාලය භාරයේ පවතී.<br>302 – 0610 වාහනයේ ලියාපදිංචි අයිතිය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් | විගණනයට අවශ්‍ය සාක්ෂි නිවැරදිව ඉදිරිපත් කල යුතුය |

| | | | |
|---|---|---|---|
| | | නමින් පවතී. ඒ අනුව ඉදිරියේදී ලියාපදිංචි අයිතිය නිරවුල් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. | |
| (ආ) | අමාත්‍යාංශය සතු වාහන 8 ක් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ද, වාහන 3ක් වෙළඳ අමාත්‍යාංශයට ද වාහන 5ක් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපිර්තමේන්තුව ද වාහන 3ක් වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ද වාහන 1ක් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ද වාහන 1 සමාජ සේවා අමාත්‍යාංශයටද සහ වාහන 3ක් වී අලෙවි මණ්ඩලයටද මුදාහැර තිබූ අතර එම වාහන මුදාහැරීමේ පදනම සහ අනුමැතීන් විගණනයට ඉදිරිපත් නොවීය. | CAU – 3194 / CAH – 1634/ CAF – 4619 / KX – 8612 / KX -8135 වාහන කෘෂිකර්ම ගරු අමාත්‍යතුමාගේ හා එතුමාගේ කාර්ය මණ්ඩලයේ නිල රථ වශයෙන් අනුයුක්ත කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශයට තාවකාලිකව ලබා දී ඇත.<br>KX – 7037 හා KO – 5114 වාහන කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජල සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශය වෙත තාවකාලිකව ලබා දී ඇත.<br>PF – 6976 - මෙම වාහනය කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත තාවකාලිකව ලබා දී ඇත.<br>KO – 4865 / GF – 9312 / PD – 8931 වාහන වෙළඳ අමාත්‍යාංශය වෙත පවරා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කරන බව සඳහන් කරමි.<br>64 – 3179 , 302 – 0610, CAG – 8807, KX – 7664 , KA – 6702 වාහන සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත.<br>KW - 9992 / KY - 4046 / KX – 8136 මොහාන් පී ද සිල්වා මැතිතුමා වෙත 2021.07.08 දින වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ධූරය හිමිවීමත් සමඟ එම නව අමාත්‍යාංශයේ ද නිල රථ වශයෙන් භාවිතා කිරීමට මෙම වාහන රැගෙන ගොස් ඇත.<br>KO – 0024 - මෙම ජීප් රථය තාවකාලික පදනම මත ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත ලබා දී ඇත.<br>CAA – 0024 - මෙම වාහනය සමාජ සවිබල ගැන්වීම් අමාත්‍ය ධූරය හිමි අමාත්‍යවරයා විසින් 2018 වර්ෂයේදි නිල රථයක් වශයෙන් පරිහරණය කිරීම සඳහා රැගෙන ගොස් ඇත.<br>KY – 7364, GD – 2079 වාහන වී අලෙවි මණ්ඩලය වෙත අනුයුක්ත කර ඇති අතර KY – 5290 රථය 2015.09.28 දින සිට වී අලෙවි මණ්ඩලයේ රාජකාරි කටයුතු සඳහා භාරගෙන ඇත. | විගණනයට අවශ්‍ය සාක්ෂි නිවැරදිව ඉදිරිපත් කල යුතුය |

## 2 මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව පිළියෙල කිරිමේදී වැය විෂයන් 07 ක විචලතාවය සෘණ සියයට 50 සිට ධන සියයට 481 අතර පරාසයක් වෙනස් වී තිබූ බව නිරික්ෂණය විය | 2001 වැය විෂය සඳහා රු. 4,812,746 ක අතිරේක ප්‍රතිපාදන ලබාගැනීම සහ 2021 වර්ෂය තුල පැවති වසංගත තත්වයට මුහුණ දීම සඳහා ඇතැම් වැය විෂයන් වලට ලබාදී ඇති ප්‍රතිපාදන ඉක්මවා වියදම් දැරීමට සිදුවීම නිසා ප්‍රතිපාදන මාරුකිරීමෙන් වියදම කළමණාකරණය කිරීමට සිදු වූ බව කාරුණිකව දන්වමි. | මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව වඩාත් නිවැරදි ලෙස සකස් කල යුතුය. |
| **(ආ )** | වැය විෂයන් වල සංශෝධිත ඇස්තමේන්තුවෙන් ඉතිරිවීම් සියයට **20** සිට සියයට **100** දක්වා ඇති අවස්ථා **12**ක් නිරීක්ෂණය විය. | කොවිඩ් වසංගත තත්වය නිසා සමහර වැය විෂයන්වල වියදම ඇස්තමේන්තුගත ප්‍රමාණයට වඩා අඩුවශයෙන් දැරීමට සිදුවිය. | අදාල ඇස්තමේන්තු හැකිතාක් නිවැරදි අයුරින් පිළියෙල කල යුතුය. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයට අදාලව අමාත්‍යාංශය විසින් බැරකම් සඳහා බැදීම් ඇතිකර ගැනීමේදී (427-01-02-1301) වාහන නඩත්තු වියදම් වැය විෂයෙහි ඉතිරිවීම් සම්බන්ධයෙන් කටයුතු කිරිමකින් තොරව ප්‍රතිපාදන ඉක්මවා රු.929,084 බැරකම් සඳහා බැදීම ඇතිකරගෙන තිබූ බව නිරීක්ෂණය විය. | මෙම අමාත්‍යාංශය සතුව ඇති වාහන වලින් වැඩි ප්‍රමාණයක් ඉතා පැරණි (වසර 15 කට වඩා වැඩි) වාහන බැවින් එවැනි වාහන නඩත්තු කිරීම සඳහා ඇස්තමේන්තු කරන ලද වියදමට වඩා වැඩි වියදමක් දැරීමට සිදුවී ඇත. | මුදල් රෙගුලාසි **94 (1)** ප්‍රකාරව ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට බැදීම් වැලැක්වීම සඳහා අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම හදුන්වා දිය යුතු වීම. |

## 2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

---

අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම අදාළව පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණ විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සේවය හැරගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු වසර 05ට වඩා වැඩි ණය ශේෂය රු.99,450ක් අයකර ගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV ජේදයේ 4.5 වගන්තිය අනුව කටයුතු කර නොතිබුණි. මියගිය නිළධාරීයෙකුගෙන් අයවිය යුතු වසර 02ට වැඩි ණය ශේෂයක් වන රු.152,745 අයකර ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ XXI ජේදයේ 4.4 වගන්තිය අනුව කටයුතු කර නොතිබුණි. | සේවය හැර ගිය කේ..ජී.ආර් ජයශාන්ත මහතාගේ ආපදා ණය මුදල වන රු.36,390.00 නීතිපති උපදෙස් මත පොත්වලින් කපා හැරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධක්ෂක ජනරාල් වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.<br><br>සේවය හැර ගිය සංවර්ධන සහකාර කේ.යු.ටී.පෙරේරා මියගේ රු.62,519.49 ක ආපදා ණය ශේෂයේ අය කර ගැනීමට කටයුතු යොදන ලෙස ජාතික රක්ෂණ භාර අරමුදල වෙත දන්වා ඇති නමුත් මෙතෙක් නිසි පිළිතුරක් ලබා දී නොමැත. | ආයතන සංග්‍රහයේ වගන්ති අනුව කටයුතු කර ණය අයකර ගැනීම සඳහා අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම හඳුන්වා දිය යුතු වීම. |
| (ආ) | මුදල් රෙගුලාසි 485(4) ප්‍රකාරව ස්ථාන මාරුවී ගිය නිළධාරීන්ගෙන් තවදුරටත් අයවිය යුතුව ඇති ශේෂය නිරවුල් කරගත යුතු වුවත් වසර 1ත් 2ත් අතර වූ රු.200,700 වන ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | . සංවර්ධන නිළධාරී ලෙස සේවය කළ පී.ඩී.සී.පී.ගුණරත්න මහතාගේ ආපදා ණය ශේෂය නිරවුල් කරන ලෙස රත්නපුර කලාප අධ්‍යාපන කාර්යාලය වෙත ලිපියක් මඟින් දන්වා ඇත. | මුදල් රෙගුලාසි **485(4)** ප්‍රකාරව කටයුතු කර ණය අයකර ගැනීම සඳහා අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම හඳුන්වා දිය යුතු වීම. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | | නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | | **අනුකූල නොවීම** | | |
| (අ) | 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය | 2021 වර්ෂයේ දී මිළ දී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාල වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂයේ මිලදී ගන්නා ලද හා අපහරණය කරණ ලද අනෙකුත් වත්කම් පිළිබඳ තොරතුරුද කඩිනමින් ලබාදීමට කටයුතු සලසා ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතුකල යුතුය. |
| (ආ) | **2020.10.02 දිනැති වත්කම් කළමණාකරණ චක්‍රලේඛ අංක 5 / 2020 02 (අ)** | ධාවන තත්වයේ නොපවතින වාහන 2020.12.31 දිනට පෙර අපහරණය කළ යුතු වුවත් 251-0747 , JR - 2899 , හා 65-6120 යන ධාවනයට නුසුදුසු තත්වයේ පවතින වාහන 03 ක් අමාත්‍යාංශ පරිශ්‍රයේ ගාල් කර පැවතිණි. | අපහරණය කළ යුතු වාහන හඳුනාගැනීම සඳහා පත් කරන ලද විශේෂ සමීක්ෂණ මණ්ඩලය වෙත අදාළ වාහන 03 ඉදිරිපත් කරන ලදී. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | **ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | | | |
| | (i) 2.14.1 හි 3 ඡේදය | අමාත්‍යාංශය විසින් ප්‍රසම්පාදනකරුවන් හා කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ලේඛනයක් නඩත්තු කර ,නොතිබුණු අතර බහුලව මිලදී ගැනීම් සිදුකර තිබුණේ වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය යොදාගනිමිනි. | කෘෂිකර්ම අමාත්‍යාංශයේ වාර්ෂිකව ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලේඛනයෙන් අදාළ තොරතුරු ලබාගෙන අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදුකරනු ලබයි. ඉදිරියේදී කෘෂිකර්ම අමාත්‍යාංශයේ වාර්ෂිකව ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලේඛනය අප අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත්කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය |

| | | | |
|---|---|---|---|
| (ii) 2.7.4 ඡේදය | අමාත්‍යාංශය විසින් විශාල කොන්ත්‍රාත් හා සුළු කොන්ත්‍රාත් සඳහා ප්‍රසම්පාදන කමිටුව තුළ විකල්ප සාමාජිකයෙකු පත්කර නොතිබුණි. | අමාත්‍යාංශය විසින් පත්කර ඇත්තේ සුළු කොන්ත්‍රාත් සඳහා ප්‍රසම්පාදන කමිටුව බව කාරුණිකව දන්වමි. එසේම ප්‍රසම්පාදන කමිටුව සඳහා විකල්ප සාමාජිකයකු පත්කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය |
| (iii) 4.2.1 ඡේදය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ආකෘතියට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි එම එක් එක් ප්‍රසම්පාදන කාර්යය ආරම්භක කිරීමට අපේක්ෂිත දිනය හා අවසන් කිරීමට අපේක්ෂිත දිනය සඳහන් කළ යුතු වුවත් "අවශ්‍යතාව පරිදි" යනුවෙන් සටහන් කර තිබුණි . | එකඟ වෙමි. 2022 වසරේ සිට ආරම්භ කරන සහ අවසන් කරන දිනය නිශ්චිතව දක්වමින් ප්‍රසම්පාදන කාලරාමුව සකස්කර ඇති බව දන්වා සිටිමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය |
| (iv) 8.9.3 හි (ආ)ඡේදය | රු.500,000ක් ඉක්මවන භාණ්ඩ හා වැඩ කොන්ත්‍රාත් සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹිය යුතු වුවද මාර්ගගත ක්‍රමයට රුස්වීම් පැවැත්වීම සඳහා ශබ්ද පරිපාලන ඒකකයක් ස්ථාපිත කිරීම, වර්ක් ස්ටේෂන් මිලදී ගැනීම, ඩෙස්ක්ටොප් පරිගණක 10ක්, ලැප්ටොප් පරිගණක 05ක් හා ෆොටෝ කොපි යන්ත්‍ර 03ක් මිලදී ගැනීම හා ලැප්ටොප් පරිගණක 05 ක් මිලදී ගැනීම යන ප්‍රසම්පාදනය අවස්ථා 04 සඳහා රු.5,416,330 වියදම් කර ඇතත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මාර්ගගත ක්‍රමයට රුස්වීම් පැවැත්වීම සඳහා ශබ්ද පරිපාලන ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා ගිවිසුමකට එළඹ නැති බව පිළිගන්නා අතර තෝරාගත් සැපයුම්කරු සමඟ සාකච්ඡා කර වසරක 2ක සේවා ගිවිසුමක් අත්සන්කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.<br>වර්ක් ස්ටේෂන් මිලදී ගැනීම සඳහා ද ගිවිසුමකට එළඹ නැති නමුත් වසර 2 ක වගකීම් කාලයක් ලබා ගෙන ඇත . ඩෙස්ක්ටොප් පරිගණක 10ක් ලැප්ටොප් පරිගණක 05ක් හා ෆොටෝ කොපි යන්ත්‍ර 03ක් මිලදී ගැනීම සඳහා ද ගිවිසුමකට එළඹ නැත. | -එම- |

3. **මෙහෙයුම් සමාලෝචනය**
**-----------------------------**

3.1 **සැලැසුම් කිරීම**
**-------------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2014 පෙබරවාරි 14 දිනැති අංක 01/2014 දරන චක්‍රලේඛයෙහි 03 ඡේදයට අනුව වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අරමුදල් අවශ්‍යතා සැලැස්ම අනුමත ක්‍රියාකාරි සැලැස්මෙහි අන්තර්ගත වී නොතිබුණි. | එකඟ වෙමි. 2020 වර්ෂයේ සිට රට තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය මත අරමුදල් වෙන් කිරීමේ අපහසුතාවයක් පැවතුණු බැවින් අරමුදල් අවශ්‍යතා සැලැස්ම අනුමත ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කිරීමට නොහැකි වූ බව කාරුණිකව දන්වා සිටිමි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | ක්‍රියාකාරි සැලැස්මෙහි අන්තර්ගත වැඩසටහන් සඳහා ඉලක්කගත කාල සීමාව 2021 ජනවාරි 01 සිට 2021 දෙසැම්බර් 31 ලෙස දක්වා තිබුණි. දියර කිරි පරිභෝජනය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීම, සත්ත්ව අභිජනන ගොවිපොළවල් ස්ථාපනය කිරීම, සූකර කර්මාන්ත සංවර්ධනය, සුළු හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළ සංවර්ධනය, කුඩා හා මධ්‍ය පරිමාණ කිරි ගොවිපොළ කළමනාකරණය තුළින් ඵලදායිතාවය ඉහළ නැංවීම යන වැඩසටහන් 05 ක්‍රියාත්මක කිරීමට යෝජිත දින සහ අවසන් කිරීමට අපේක්ෂිත නිශ්චිත දිනයන් හඳුනාගෙන නොතිබුණි. | එකඟ වෙමි. ඒ වන විට රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය මත එක් එක් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ අවසන් කිරීමේ නිශ්චිත දිනයන් දැක්වීමට අපහසු නිසා වර්ෂය තුළ ක්‍රියාත්මක වන පරිදි, 2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා ඇතුලත්කල බව කාරුණිකව දන්වා සිටිමි. | ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කිරීමේදී අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් පිළිබඳ නිසි අවධානයකින් යුතුව පිළියෙල කල යුතුය. |
| (ඇ) | ක්‍රියාකාරි සැලැස්මෙහි අන්තර්ගත වැඩසටහන් 06හි ඇතුළත් එක් එක් ව්‍යාපෘතීන් මෙහෙයවීම හා කාර්යසාධනය පරීක්ෂාව සඳහා රුපියල් මිලියන 5ක් වෙන්කර ඇති නමුත් ක්‍රියාකාරි සැලැස්මෙහි ඒ සඳහා නිර්ණායක (Key Performance Indicator) හඳුනාගෙන නොතිබුණි | එකඟ වෙමි. එක් එක් ව්‍යාපෘතීන් මෙහෙයවීම, කාර්ය සාධන පරීක්ෂාව සඳහා නිර්ණායක (KPI) සහ වෙන්කළ ප්‍රතිපාදන විස්තරාත්මකව ඉදිරිපත් කර ඇත. | **2014** පෙබරවාරි **17** දිනැති අංක **01/2014** දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරි සැලැස්ම සකස්කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| **(ඇ )** | කුඩා හා මධ්‍ය පරිමාණ කිරි ගොවිපොළ කළමනාකරණය තුළින් ඵලදායිතාවය ඉහළ නැංවීමේ වැඩසටහන යටතේ දක්වා ඇති රෝග නිවාරණය සහ ඩිජිටල්කරණය ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන **27**ක් වෙන්කර ඇති අතර එම ව්‍යාපෘතිය යටතේ කොපමණ උපකරණ ලබාගන්නේද සහ රෝග නිවාරණය සිදුකරන ආකාරය පිළිබඳ තොරතුරු පැහැදිලිව දක්වා නොතිබුණි. | එකඟ වෙමි. මෙම රු.මි. 27න් රු.මි. 25ක් පශු සම්පත් ක්ෂේත්‍රයේ දත්ත එක්රැස් කිරීමට මෘදුකාංග පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා වෙන් කළ ද එවකට පැවති තත්ත්වය යටතේ එය සිදු කිරීමට නොහැකි විය. තවද, ඉතිරි රු.මි. 2.00ක් රෝග නිවාරණ හා අදාළ උපාංග ලබා ගැනීමට වෙන් කර තිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් පිළිබඳ නිසි අවධානයකින් යුතුව පිළියෙල කල යුතුය**.** |
| **(ඉ )** | දියර කිරි පරිභෝජනය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීමේ වැඩසටහන යටතේ රාජ්‍ය ආයතන සඳහා වෙන්ඩින් මැෂින් 40ක් ලබා දීමේ ව්‍යාපෘතියක් ඇතුළත් කර රුපියල් මිලියන **03**ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. මේ සඳහා මිල්කෝ ආයතනය තෝරාගෙන තිබූ අතර වෙන්ඩින් මැෂින් ලබා දිම වෙනුවට කිරි සිසිලක යන්ත්‍ර **75**ක් ලබාදීමට කටයුතු කර ඇත. එබැවින් ක්‍රියාකාරි සැලැස්ම සැකසීමේදී නිවැරදි අවශ්‍යතාවයන් සොයා බලා ව්‍යාපෘති ඇතුළත් කිරීමට අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය. | රටේ පැවති වාතාවරණය තුළ වෙන්ඩින් මැෂින් නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය සඳහා ණයවර ලිපි විවෘත කිරීමට තිබූ අපහසුතාවය හේතුවෙන් කිරි සිසිලක යන්ත්‍ර ලබා දීම ලේකම්තුමාගේ අනුමැතිය සහිතව සිදු කරන ලදී. මෙම මාරු කිරීම සිදු කරන ලද්දේ 2021.12.06 වන දින බැවින් එය ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් නොවේ. | -එම- |
| **(ඊ )** | කුඩා හා මධ්‍ය පරිමාණ කිරි ගොවිපොළ කළමනාකරණය තුළින් ඵලදායිතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය සඳහා වෙන්කර ඇති රුපියල් මිලියන 450න් රුපියල් මිලියන 275.24ක් වැය කර ඇති බව දක්වා ඇතත් එහි සඳහන් ව්‍යාපෘති 12 හි එක් එක් ව්‍යාපෘතිය සඳහා වැයවූ පිරිවැය වෙන් වෙන්ව දක්වා නොතිබුණි | එම ව්‍යාපෘතිය ක්‍රියාකාරකම් රාශියකින් සමන්විත විය. එනමුදු ව්‍යාපෘතියේ සමහර ක්‍රියාකාරකම් 2021.12.31 දිනෙන් අවසන් වුවද මූල්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම, සමහරක් ක්‍රියාකාරකම් සඳහා උපකරණ මිලදී ගැනීමේදී රටේ පැවති තත්ත්වය මත බැංකු විසින් ඩොලර් නිකුත් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් එම ක්‍රියාකාරකම්වලට අදාළ ප්‍රතිපාදන අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුමට මාරු කිරීමට සිදුවූ අතර වර්ෂ අවසානයේ මුළු වියදම ලෙස රු.මි. 275.24 ක් දක්වා ඇති බව සඳහන් කරමි. | -එම- |

| | | | |
|---|---|---|---|
| (උ ) | ගවයන් 100,000**ක්** හඳුනාගැනීම සහ මිල්කෝ ආයතනය වෙත අභිජනන උපකරණ ලබාදීම යන ව්‍යාපෘති 02 ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර පිළිවෙලින් රුපියල් මිලියන 13ක් හා රුපියල් මිලියන 5.1**ක** ප්‍රතිපාදන වෙන්කර ඇතත් එම ව්‍යාපෘතින් සඳහා ප්‍රසම්පාදන කටයුතු සත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය දෙපාර්තමේන්තුව මඟින් ඉටු කර තිබුණි. | ගවයින් 100,000ක් හඳුනාගැනීම සහ මිල්කෝ ආයතනය වෙත අභිජනන උපකරණ ලබා දීමට පිළිවෙලින් වෙන් කරන ලද්දේ රු.මි.8 ක් සහ රු.මි.5.1 ක් වන අතර මුළු එකතුව රු.මි.13.1කි. මෙම කාර්යයන් 02ක සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම සහ මිලදී ගැනීම් සිදු කරන ලද්දේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟිනි. කන් සලකුණු මිලදී ගැනීම් සහ අභිජනන උපකරණ මිලදී ගැනිම් සිදු කරන ප්‍රමුඛ ආයතනය සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවයි. 2021 වර්ෂයේදී සත්ත්ව අභිජනන උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ඔවුන් විසින් ටෙන්ඩර් කැඳවීමක් සිදු කර තිබූ අතර, එම ටෙන්ඩර් තීරණය අනුව නැවත ඇණවුම් කිරීමේ ක්‍රමය පදනම් කරගනිමින් එම මිල ගණන් යටතේම මෙම උපකරණ මිලදී ගැනීම සිදු කරන ලදී. | -එම- |

**3.2** **කාර්යභාරයන් ඉටු නොකිරීම**

**---------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂය තුළ ආරම්භ කිරීමට අපේක්ෂිතව තිබූ රුපියල් මිලියන 02ක ඇස්තමේන්තුගත පිරිවැයකින් යුතු පුන්තෝට්ටම් ප්‍රාදේශීය පශු සම්පත් ගොවිපොළෙහි යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය 2021 වර්ෂය තුළ ආරම්භ කොට නොමැති බව නිරීක්ෂණය විය. | එවකට රටතුල පැවති තත්ත්වය හා ගොඩනැගිලි ද්‍රව්‍යවල අධික ලෙස මිල ඉහල යෑම නිසා කොන්ත්‍රාත්කරු නියමිත කාලයට වැඩ ආරම්භ නොකිරීම නිසා, 2021 වසර තුළ පුන්තෝට්ටම් ප්‍රාදේශීය පශු සම්පත් ගොවිපොළෙහි යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | ක්‍රියාකාරී සැලැස්ම තුලට ඇතුලත් කරනු ලබන කාර්යයන් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව සම්පූර්ණ කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2021 වසර තුළ ආරම්භ කිරීමට නියමිතව තිබූ පේදුරුතුඩුව පශු වෛද්‍ය කාර්යාලය ඉදිකිරීමේ ව්‍යාපෘතිය එම වසර තුළ ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | නව ව්‍යාපෘති ආරම්භ කිරීමට 2021 වසර සඳහා මුදල් ප්‍රතිපාදන ලබාදීම මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛයක් මඟින් නවතා ඇති හෙයින්, මෙම ව්‍යාපෘතිය 2021 වසරේ දී ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | -එම- |

**3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

---------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සත්ව අභිජනන ගොවිපොළවල් ස්ථාපනය කිරීමේ වැඩසටහන යටතේ වැඩමුළු/පර්යේෂණ සහ පුහුණු වැඩසටහන් 20ක් ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයවීම හා කාර්යසාධන පරීක්ෂාව සඳහා ව්‍යාපෘතීන් **02**ක් ඇතුළත් කර ඒ සඳහා පිළිවෙලින් රුපියල් මිලියන **2**ක් හා රුපියල් මිලියනයක් වෙන්කර ඇතත් එහි ප්‍රගතිය පිළිබඳ තොරතුරු කිසිවක් කාර්යසාධන වාර්තාවෙහි ඇතුළත් කර නොතිබුණි | පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කරන ලද පරිදි අදාළ වැඩමුළු, පර්යේෂණ හා පුහුණු වැඩසටහන් පැවැත්වීමට අපහසු වූ බව කාරුණිකව දන්වා සිටිමි. | අදාල තොරතුරු නිවැරදි ලෙස ඉදිරිපත් කිරිමට කටයුතු කල යුතුය. |

**3.4 පාඩු හා හානි**

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් මුදල් රෙගුලාසි **106** හා **113** යටතේ වන පාඩු අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ කාල විශ්ලේෂණයට අනුව වසර **5** ට වැඩි හානි **128,204** හා වසර **5** ට අඩු රු **68,200** ලෙස එකතුව රු.**196,404** ක් වූ හානි හා පාඩු වටිනාකම අදාල වගකිවයුතු පාර්ශවන්ගෙන් අයකර ගැනීමට හෝ පොත් වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි. | රු.68,200ක් වූ අගය රු.52,000 ක් ලෙස නිවැරදි විය යුතු අතර, අත් වැරදීමකින් අංක **KQ -** 6416 දරන වාහනයට අදාළව තවදුරටත් අය කර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති රු.1200ක මුදල වෙනුවට එහි සම්පූර්ණ අලාභයේ වටිනාකම වන රු.17400 ගණනය කිරීම හේතුවෙන් උක්ත රු.68,200.00ක අගය එකතුව ලැබී ඇත.<br>ඒ අනුව තවදුරටත් අය කර ගැනීමට හෝ පොත් වලින් කපා හැරීමට හෝ අත්හැරීමට ඇති හානි හා පාඩු වටිනාකම රු.180,204.78 ක් වේ.<br>**(i) KA -** 6702 - අනතුරට අදාළ අලාභය රු.128,204.78ක් වන අතර, ඉන් රු.52,312.88 ක මුදලක් රියදුරුට හිමි වන පාරිතෝෂික මුදලින් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. අලාභයේ ඉතිරි මුදල පොතෙන් කපා හැරීම සඳහා නීති උපදෙස් ලැබී ඇති බැවින්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලින් අදාළ මුදල අයකර ගැනීමෙන් පසු ඉතිරි අලාභ මුදල පොතෙන් කපා හැරීමට කටයුතු කරනු ලැබේ. | හානි හා පාඩු වටිනාකම අදාල වගකිවයුතු පාර්ශවන්ගෙන් අයකර ගැනීමට හෝ පොත් වලින් කපා හැරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | **(ii) KQ -** 6416 - අනතුර පිළිබඳව මු.රෙ.104 (4) අවසාන පරීක්ෂණයේ නිර්දේශ මත අදාළ අලාභය අය කර ගැනීමට හෝ පොතෙන් කපා හැරීමට හෝ අත්හැරීමට කටයුතු කරනු ලැබේ.<br>**(iii) KT** – 8467 - රථය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රක්ෂණ ආයතනය විසින් රක්ෂණ හිමිකම් යටතේ ගෙවීම් කරන ලද මුදල සම්බන්ධ විස්තර එම ආයතනයෙන් විමසා ඇති අතර, ඊට පිළිතුරු ලද පසු අනතුර සම්බන්ධයෙන් මු.රෙ.104 (4) අවසාන පරීක්ෂණයේ නිර්දේශ මත අදාළ අලාභය අය කර ගැනීමට හෝ පොතෙන් කපා හැරීමට හෝ අත්හැරීමට කටයුතු කරනු ලැබේ. | |

**3.5 කළමනාකරණ දූර්වලතා**

-----------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය විසින් නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ආයතන වෙතින් ලබාගෙන තිබූ අංක PG-1773, CAB-4184, PF-7316 , PH-0474 , PF-7639, PF-8209 දරන වාහන **06**ක අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි. | **PG-**1773 - වාහන අයිතිය පවරා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී.<br>**CAB-**4184, **PF-**7316 , **PH-**0474 , **PF-**7639 – තාවකාලික පදනමින් ලබාදී ඇති බැවින් වාහන අයිතිය පවරා ගැනීමට කටයුතු සිදු නොකරන ලදි . | වාහන අයිතිය පවරා ගැනීමට කටයුතු කල යුතුය |
| (ආ ) | අමාත්‍යාංශයේ **2021** භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ට අනුව ලෙජරය අනුව ශේෂය හා තත්‍ය ශේෂය අතර අතිරික්ත භාණ්ඩ අයිතම **205**ක් ද භාණ්ඩ අයිතම **366**ක ඌනතාවයක් ද නිරීක්ෂණය විය. | අප අමාත්‍යාංශය කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් ගොඩනැගිල්ලක පවත්වා ගෙන යනු ලබයි. එබැවින් විදුලි පංකා<br>36ක ප්‍රමාණයක් හා විදුලි බල්බ 59ක ප්‍රමාණයක් ලෙස සඳහන්ව ඇති විදුලි උපකරණ අප අමාත්‍යාංශයට අයත් නොවන අතර ඒවා කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් විදුලි උපකරණ වේ. එහෙත් අප විදුලි උපකරණ ලේඛනයේ මෙම අයිතමයන් ඇතුලත් කර ඇත. ඒ හේතුවෙන් එම අයිතමයන් ඉන්වෙන්ට්‍රි ලේඛනය සඳහා ඇතුලත් කර නොමැත. | ඉන්වෙන්ට්‍රි ලේඛනය නිවැරදිව යාවත්කාලිනව පවත්වාගත යුතුය |

| | | | |
|---|---|---|---|
| (ඇ ) | අමාත්‍යාංශයේ 2021 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවෙහි ඇතුලත් වුවත් ප්‍රධාන ඉන්වෙන්ට්‍රි ලේඛනයෙහි ඇතුළත් නොවූ භාණ්ඩ අයිතම 193 ක් නිරීක්ෂණය විය . | අයිතම 04 ක ප්‍රමාණයක් 2022 වර්ෂයේ එම අංශ විසින් ලබා ගන්නා ලද භාණ්ඩ වේ.ෙ<br>එමෙන්ම භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් ලබා දුන් වාර්තාව සලකා බලා අදාල අයිතමයන් 44 ක ප්‍රමාණයක් ඉන්වෙන්ට්‍රි ලේඛනය තුල ඇතුලත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලබන බව දන්වනු කැමැත්තෙමි. | ඉන්වෙන්ට්‍රි ලේඛනයෙහි ඇතුළත් නොවූ භාණ්ඩ ඇතුලත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකල යුතුය**.** |
| (ඈ ) | අමාත්‍යාංශයේ හණ්ඩ කේතකරණයකට ලක් නොකිරීම හේතුවෙන් එකම අයිතමය විවිධ නම් වලින් සටහන් වීමට හැකි බැවින් භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිවැරැදිතාවය පිළිබඳ විගණනයට ගැටලුකාරී විය | 2022 වර්ෂයේ සිට **CIGAS** පද්ධතියට අනුව භාණ්ඩ කේතකරණය කිරීමට අදාල කටයුතු මේ වන විට සිදුකරමින් පවතී. | ස්ථාවර වත්කම් හණ්ඩ කේතකරණයකට ලක් කල යුතුය**.** |
| (ඉ) | ස්ථාවර වත්කම් ලෙජරයහි ස්ථාවර වත්කම් වර්ග **30** ක වටිනාකම් කිසිවක් සටහන් කර නොතිබුණි | 2021 වර්ෂයේ සිට නව ලේඛණයක් සැකසීමෙන් පසුව එහි සඳහන් වත්කම් සහ CIGAS පද්ධතියේ වත්කම් ශේෂ අතර යම් වෙනසක් දක්නට ලැබේ. එයට හේතු වී ඇත්තේ 2020 වර්ෂයට පෙර පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණ මගින් අපහරණය කරන ලද භාණ්ඩ හා පවරාදීම් සිදු කරන ලද භාණ්ඩ CIGAS පද්ධතියෙන් ඉවත් කිරීමට කටයුතු කර නොමැති වීමය. එම තොරතුරුද මේ වන විට නිවැරදි කරමින් පවතින බව දක්වනු කැමැත්තෙමි. | ස්ථාවර වත්කම් ලෙජරයහි සියලු ස්ථාවර වත්කම් වටිනාකම් සටහන් කල යුතුය. |
| (ඊ) | ස්ථාවර වත්කම් ලෙජරයහි ස්ථාවර වත්කම් **08** ක **2021** ජනවාරි **01** දිනට පැවැති ශේෂයන් සටහන් කර නොතිබුණි | 2021 වර්ෂයේ සිට විධිමත් පරිදි මෙම අමාත්‍යාංශය යටතේ නව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාම සිදු කරනු ලබන අතර එහි ඇතුලත් කිරීම සඳහා 2021.01.01 දිනට ඇතැම් ස්ථාවර වත්කම්වල පෙර පැවති භෞතික ශේෂයන් හඳුනා ගැනීමට අපහසු වී ඇත. ඒ අනුව මේ වන විට මෙයද නිවැරදි කරමින් පවතින බව දන්වනු කැමැත්තෙමි. | ස්ථාවර වත්කම් ලෙජරයහි සියලු<br><br>ස්ථාවර වත්කම් සටහන් කල යුතුය. |

4. **මානව සම්පත් කළමනාකරණය**

**-------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ **2021** වර්ෂය සඳහා අනුමත කාර්ය මණ්ඩලය **594** ක් වුවද තත්‍ය කාර්ය මණ්ඩලය **559** ක් වීමෙන් තනතුරු **37** ක් පුරප්පාඩුව පැවතුණි. | එකඟ වෙමි.<br>අධ්‍යක්ෂ (සැලසුම්) තනතුරෙහි නිලධාරියෙකු සිටින බැවින් මේ වන විට පුරුප්පාඩු වී නොමැත.<br>සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ **III/ II** ශ්‍රේණිවල නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ / පශු වෛද්‍ය නිලධාරි තනතුරු 08 ක් අනුමත කර තිබෙන අතර ඉන් තනතුරු 03 ක් පුරප්පාඩුව ඉදිරියේදී ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථා සංශෝධනය සිදු කිරීමෙන් අනතුරුව එම තනතුරු සඳහා නිලධාරීන් පත් කිරීමට නියමිතව ඇත.<br>සහකාර ලේකම් පුරප්පාඩු වූ තනතුරු සංඛ්‍යාව 02 කි. | අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව මත පදනම්ව අත්‍යාවශ්‍ය තනතුරු සඳහා වන පුරප්පාඩු පිරවීමටත් අතිරික්තයක් ඇති නොවන පරිදි බඳවා ගැනීම් සිදුකිරීමටත් කටයුතු කල යුතුය. |
| **(ආ)** | අංක 2/ 2018 හා 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් ඇමුණුම 02 ආකෘතිය ප්‍රකාරව කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුම ඇතුළත් වන පරිදි අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ලබා දෙමින් මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර අමාත්‍යාංශ කාර්ය මණ්ඩල නිලධාරීන් 20 දෙනකු සඳහා පමණක් රු.160,500 ක් වැය කරමින් වැඩමුළු/සම්මන්ත්‍රණ 05 ක් සමාලෝචිත වර්ෂය තුළ දී පවත්වා තිබුණි. | රා.පරි.ච. 02/2018 අනුව 2022 හා 2023 වර්ෂ සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකසා ඇත | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් ඇමුණුම **02** ආකෘතිය ප්‍රකාරව කාර කටයුතු කල යුතුය. |